# රොබට් නොක්ස් හා මෙරට උගත්තු

පැරණි ලංකාවේ නීති පද්ධතියක් මෙන් ම අධිකරණයක් ද තිබිණි. එහෙත් විවාහය අවලංගුකිරීම වැන්නක් රජ්ජුරුවන්ගේ සෘජු හෝ වක්‍ර නායකත්වයෙන් තිබූ අධිකරණයක තීන්දු නො වී ය. ඒ සඳහා තිබුණේ වෙනම ම අධිකරණයකි. එසේත් නැතහොත් ගමේ වැඩිහිටියන්ගේ සභාවකි. ඇතැම්විට ගමෙහි වැඩිහිටි සියල්ලන්ම එයට සහභාගිවූවා විය හකි ය. විවාහයක් අවලංගුකිරීමේ දී අඩුම තරමින් අදාළ පවුල් දෙකේ වැඩිහිටියන්ගේ ඒ සභාවට සහභාගිවූවා විය හැකි ය. සභාව කුමක් වුවත් ඒ අධිකරණයක් විය. එයට ආධිපත්‍යය ලැබුණේ එවකට තිබූ සිංහලේ නීතියෙනි.

රොබට් නොක්ස්ට මෙන් ම මෙරට ඊනියා උගතුන් ද නොසලකන කරුණක් නම් එංගලන්තයේ එදා (හෝ අද හෝ) ක්‍රියාත්මක වූ නීතියක් ඔස්සේ ලංකාවේ ක්‍රියාත්මක වූ නීතිය විවරණය කරගත නො හැකි බව ය. එංගලන්තයේ තිබූ නීතිය අපේ රටේ නොතිබිණි ය යන්නෙන් මෙරට කිසිම නීතියක් නොතිබූ බවක් නො කියැවෙයි. රොබට් නොක්ස් ඇතැම් කරුණුවල දී මෙරට නීති පද්ධතියක් ගැන නොකියන්නේ එබැවිනි.

මෙහි දී සඳහන්කළ යුතු තවත් කරුණු දෙකක් ඇත. ලංකාවේ එකල, එනම් රොබට් නොක්ස් පැමිණි සමයෙහි මෙන් ම එයට පෙර ද, පසුව ඉත් මෑතක් වන තුරු ද, දූප්පත් පොහොසත් භේදයකින් තොරව විස්තෘත පවුල ක්‍රියාත්මක වූ බව ය. විස්තෘත පවුල දෙමව්පියන්ට හා දරුවන්ට පමණක් සීමා නො වී ය. නැන්දලා,මාමලා, බාප්පලා, සියලා, ආච්චිලා ආදී වශයෙන් ඥාතීහු විස්තෘත පවුලේ සාමාජිකයෝ වූහ. යුරෝපයේ ද බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට පෙර විස්තෘත පවුල විය. එහෙත් රොබට් නොක්ස් සමයෙහි එංගලන්තයෙහි විස්තෘත පවුල වෙනුවට දෙමව්පියන් හා දරුවන් සහිත න්‍යෂ්ටික පවුල ආදේශ වෙමින් පැවතිණි.

මෙහි ප්‍රතිඵලය වූයේ විස්තෘත පවුලක දරුවන් සම්බන්ධ වගකීම දෙමව්පියන්ගෙන් ඔබ්බට යෑම ය. දරුවන් හදාවඩා ගැනීමේ කාර්යය දෙමව්පියන්ට පමණක් සීමා නො වී ය. ඒ හේතුව වැදගත්වන්නේ යම්කිසි අයුරකින් විවාහය අවලංගු කෙරුණ ද, දරුවන්ගේ වැඩි දියුණුවට ඒ විශාල වශයෙන් බල නො පෑම ය. එය පැරණි ලංකාවේ විවාහ අවලංගුකිරීමට අනුබලයක් වී යැයි යමකුට සිතෙන්නට පුළුවන. එහෙත් එය වැරදි සිතුවිල්ලකි. විවාහය යනු දෙදෙනකු සම්බන්ධකිරීමකට වඩා පවුල් දෙකක් සම්බන්ධකිරීමක් යන්න දරුවන් සම්බන්ධයෙන් ද වැදගත් විය.

දරුවෝ ද පවුලේ ම සාමාජිකයෝ වූහ. දරුවන් වෙනුවෙන් දෙමව්පියෝ ද අනෙක් අය ද තම යුතුකම් හා වගකීම් ඉටුකිරීමට බැඳී සිටියහ. සිංහල බෞද්ධ සංස්කෘතියෙහි ඒ සම්බන්ධකම් සිගාලොවාද සූත්‍රයෙන් ද වෙනත් සූත්‍ර හා ජාතකකතාවලින් ද අවධාරණය කෙරිණි. අද ද මෙරට දෙමව්පියෝ තම දරුවනට වෙනත් දෙමව්පියනට වඩා බැඳී සිටින්නේ මේ යුතුකම් හා වගකීම් හේතුකොටගෙන ය. සිංහල බෞද්ධ සංස්කෘතියෙහි ඇති මේ ගුණය මෙරට අනෙක් සංස්කෘතීන්ට ද පැතිරීගොස් ඇත.

දරුවන් සම්බන්ධයෙන් ඇති යුතුකම් හා වගකීම් ඉටුකරනු වස් දෙමව්පියෝ ඇතැම්විට තමන් දෙදෙනාට එකට ජීවත්විය නොහැකි තත්වයන් යටතේ ද දරුවන් වෙනුවෙන් එකට සිටීමට උත්සාහ ගත්හ. අද ද ඇතැම් අය, විශේෂයෙන් ම මව්වරුන් සඳහන්කරන දෙයක් නම් ළමයි වෙනුවෙන් මොන කරදර විඳගෙන වුවත් එකට සිටිනවා යන්න ය. එබැවින් යුතුකම් හා වගකීම් යන ආකල්පය ඇති තෙක් විස්තෘත පවුලේ ආධාරය දරුවන් ඇති දැඩිකිරීමේ දී වැදගත් කාර්යයක් කළ ද, දෙම්පියෝ වෙන් නොවීමට හැකි සෑම උත්සාහයක් ම දැරූහ.

එයට අමතරව රොබට් නොක්ස් තම අවධානයට යොමු නොකළ තවත් කරුණක් වූයේ සමාජක්‍රම අතර තිබූ වෙනස ය. එංගලන්තය ඒ වන විටත් ධනපති ක්‍රමය යම් ප්‍රමාණයකට ක්‍රියාත්මක වන රටක් විය. ධනපති ක්‍රමය බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි ම ප්‍රතිඵලයක් විය. පෞද්ගලික ඉන්ද්‍රිය පිනවීම, ලෝකය මිනිසා වෙනුවෙන් මවා ඇති බැවින් මිනිසුන්ට සම්පත ප්‍රයෝජනයට ගැනීමට (ගසාකෑමට) ඇති අයිතිය ආදී ආකල්ප ද, මිනිසා පොළොවට හෝ වෙනත් යමකට හෝ බැඳී නැත යන්න ද ධනපති ක්‍රමයෙහි හා එයට පදනම් වූ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි අන්තර්ගත විය.

© Prof. Nalin De Silva

දේපොළ විකිණීම, හා දේපොළ අයිති නැති අයට තම ශ්‍රමය හැරෙන්නට වෙනත් කිසිවක් නොමැතිවීම ආදිය ද ධනපති ක්‍රමයෙහි ලක්‍ෂණ විය. දරුවන් දෙමව්පියන්ගෙන්, විශේෂයෙන් ම පියවරුන්ගෙන් වෙන්කිරීම (රැකියාවල නිරතවීමට පිරිමින්ට ඈත ප්‍රදේශවලට යෑමට සිදුවීම මුල්කරගෙන) නිසා දරුවන් හදාවඩා ගැනීම ද ක්‍රමයෙන් තවත් ආර්ථික සම්බන්ධතාවක් පමණක් බවට පත්වීම ද මෙහි දී නොසලකා සිටිය නො හැකි ය. දරුවන් හා පියවරුන් අතර සම්බන්ධය ආර්ථික කටයුත්තක් බවට පත්වීම හේතුවෙන් ඉන්ද්‍රිය පිනවීම ඇතුළු වෙනත් පෞද්ගලික කටයුතු මුල්කරගෙන විවාහය අවලංගුකිරීමට යොමුවීම බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ ආවේණික ගුණයක් විය.

මේ සියල්ලෙහි ප්‍රතිඵලය වූයේ බටහිර විවාහය ඉතා පෞද්ගලික කටයුත්තක් පමණක් බවට පත්වීම ය. පවුල දරුවන් වටා ගෙතුනක් නො වී ය. විවාහය නමැති සංස්ථාවෙහි ද ප්‍රධාන වූයේ තම පෞද්ගලිකත්වය ය. විශේෂයෙන් ම පිරිමින් සම්බන්ධයෙන් ඒ එසේ විය. ගැහැණුන් දරුවන් සමග ඇති ජෛවීය බැඳීම හේතුවෙන් මව්වරුන් බටහිර ද මෑතක්වන තුරු දරුවන් ගැන ද අවධානයෙන් පසු වූ නමුත් විවාහයේ සාමූහිකත්වය යන්න බටහිරින් ගිලිහී ගිය සංකල්පයක් විය.

විවාහය හුදෙක් දෙදෙනකු අතර කෙරුණු පෞද්ගලික කරුණක් බවට පත්වූ විට එක් පාර්ශ්වයක් ඉතා සුළු පෞද්ගලික කරුණක දී වුව ද විවාහය අත්හැරීමට ඇති ඉඩකඩ වැඩිවිය. එවිට ප්‍රශ්නය වූයේ විවාහයේ අනෙක් පාර්ශ්වයේ පෞද්ගලික අයිතිය, විශේෂයෙන් ම ජීවත්වීම, ආර්ථිකය, දරුවන් නඩත්තුකිරීම ආදී ප්‍රශ්නවලට විසඳුම් ලබාගන්නේ කෙසේ ද යන්න ය. අනෙක් පාර්ශ්වයේ අයිතිය යන්න මෙහි දී බල පෑ ප්‍රධාන කරුණ විය. එය අයිතියක් මිස යුතුකමක් හෝ වගකීමක් හෝ පදනම්කරගෙන කෙරුණක් නො වී ය.

එක් අයකුගේ පෞද්ගලික අවශ්‍යතා හෝ වෙනත් පෞද්ගලික හේතු මත හෝ දෙදෙනාට පැහෙන්නට නොහැකි වූ විට හා එසේ පැහීමට උනන්දුකරවන දරුවන් කෙරෙහි බැඳීම වැනි සාධකයක් නොමැති කල වෙන්වීම යුක්තියුක්ත බව පෙන්වීම විවාහය අවලංගුකිරීමට ප්‍රමාණවත් විය. මේ යුක්තියුක්ත බව අධිකරණයෙන් තීරණය කෙරිණි. අධිකරණය අබභ්‍ය වූයේ ඒ යුක්තියුක්ත බව තීරණයකිරීමට, හා කලින් සඳහන්කළ ආකාරයට දෙවියන් වහන්සේ ඒ වෙන්වීමට කැමැත්ත පළකර ඇත්දැයි දැනගැනීමට ය.

මේ කරුණු දෙක, එනම් වෙන්වීම යුක්තියුක්ත කිරීම හා දෙවියන් වහන්සේගේ කැමැත්ත ප්‍රකාශකිරීම එකක් ම බවට පත්විය. එනම් දෙවියන් වහන්සේගේ කැමැත්ත ප්‍රකාශකෙරුණේ විවාහය අවලංගුකිරීමට යුක්තිසහගත කරුණක් හෝ කරුණු හෝ ඇති බව පෙන්වීම මගින් යැයි විශ්වාස කෙරිණි. බටහිර විද්‍යාවෙහි ද මෙවැන්නක් ක්‍රියාත්මක විය. දෙවියන් වහන්සේ ලෝකය (විශ්වය) මවා ඇති ආකාරය බටහිර විද්‍යාවෙහි ප්‍රවාද මගින් දැනගැනීමට අවස්ථාව ලැබුණේ ඒ ප්‍රවාද මගින් ලැබෙන නිගමන (අපෝහන - deductions) කෙතරම්දුරට ප්‍රායෝගිකව පිළිබිඹු වන්නේ දැයි විමසා බැලීමෙනි.

බටහිර විද්‍යාවෙහි දැන් මේ කරුණ තරමක් වෙනස් වෙමින් පවතීය යන්න මෙහි දී නොකියාම බැරිය. අතීතයේ ද විද්‍යා ප්‍රවාදයක් පිළිගැනීම හෝ නොපිළිගැනීම හෝ හුදෙක් ප්‍රායෝගිකව ප්‍රවාදයේ නිගමන සංගතවේද නැත්ද යන කරුණ මත පමණක් පදනම් නො වී ය. ග්‍රහ වස්තුවල චලිතය නිවැරදිව අපෝහනයකිරීමට නොහැකි වුව ද බටහිර විද්‍යාඥයෝ නිව්ටෝනීය ගුරුත්වාකර්ෂණ ප්‍රවාදය අත්නොහැරියහ. එමෙන් ම බටහිර විද්‍යාඥයන් අයින්ස්ටයිනීය ගුරුත්වාකර්ෂණය හෙවත් සාධාරණ සාපේක්ෂතාවාදය පිළිගත්තේ ඒ ප්‍රවාදයේ නිගමන සම්බන්ධයෙන් පරීක්ෂණයක් හෝ නිරීක්ෂණයක් හෝ කිරීමටත් පෙර ය.

අයින්ස්ටයිනීය සාධාරණ සාපේක්ෂතාවාදය පිළිගැණුනේ එහි සෞන්දර්යාත්මකභාව නිසාත් එය ගණිතමය වශයෙන් සංගත වූ නිසාත් ය. අද මේ ප්‍රවනතාවය ක්වොන්ටම් භෞතිකය ආශ්‍රිත මූලික අංශු (Eementary Particles) ප්‍රවාදයන්හි පිළිකාවක් මෙන් පැතිරීගොස් ඇත. තන්තු ප්‍රවාදය (Sting Teory) නමින් හැඳින්වෙන ප්‍රවාදයෙහි අද පර්යේෂණ හෝ නිරීක්ෂණ හෝ නො කෙරෙයි. එහෙත් ඒ ප්‍රවාදය අද බටහිර භෞතික විද්‍යාවෙහි පිළිගැනී ඇත. එයට ප්‍රධාන හේතුව ඒ ප්‍රවාදය ගණිතමය වශයෙන් සංගතවීම ය.

© Prof. Nalin De Silva

බටහිර ෛද්ධාන්තික භෞතික විද්‍යාවෙහි (Theoretical Physics) ප්‍රවාදවල ගණිතමය සංගතභාවය අද පර්යේෂණාත්මක හෝ නිරීක්ෂණාත්මක සංගතභාවයට වඩා අගය කෙරෙනු දක්නට හැකි ය. දෙවියන් වහන්සේ ලෝකය මවා ඇත්තේ ගණිතයත් සමග සංගත වන අයුරින්දැයි ඇසිය හැකි අන්දමට අද බටහිර සෛද්ධාන්තික භෞතික විද්‍යාව වර්ධනය වෙයි. එය කෙතෙක් දුර දිග ගොස් ඇත් ද යතහොත් දෙවියන් වහන්සේ ගණිතඥයෙක් ද යන ප්‍රශ්නය ඇසීමේ වැදගත්කමක් වෙයි.

ලංකාවට පැමිණෙ විට රොබට් නොක්ස් දැන සිටියේ එංගලන්තයේ ක්‍රියාත්මක වූ ක්‍රමය ය. ඔහු ලෝකය දෙස බැලුයේ ඒ දෘෂ්ටි කෝණයෙනි. විවාහ අවලංගුකිරීම සම්බන්ධයෙන් ඔහු ලංකාවේ දී එංගලන්තයේ මෙන් අධිකරණයක් නො දුටුවේ ය. එබැවින් ඔහු සිතුයේ ලංකාවේ විවාහය අවලංගුකිරීම ඉතා ලිහිල් කරුණක් බව ය. ඔහු තමා සිතූ දේ ලියා තැබුවේ ය. රොබට් නොක්ස් එතරම් දැන උගතෙක් නො වී ය. ඔහු ලංකාවට පැමිණියේ ගැටවර වියෙහි දී නැවක සේවකයකු ලෙස ය. එබැවින් ඔහුගෙන් ලංකාවේ පැවති විවාහය පිළිබඳ ගවේෂණශීලී අධ්‍යයනයක් බලාපොරොත්තු විය නො හැකි ය. එහෙත් මෙරට උගත්තු රොබට් නොක්ස් සඳහන්කර ඇති දේ කිසිදු විචාරයකින් තොරව වමාරති. උගතුන් වුව ද අනුකාරකයන් වූ මොවුන්ගෙන් රොබට් නොක්ස්ගෙන් බලාපොරොත්තු නොවන දෙයක් බලාපොරොත්තු විය නො හැකි ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva